**වහාම ප්‍රකාශයට පත්කිරීම පිණිසයි**

# කුවේටය : අතවරයට ලක්වූ ගෘහ සේවක සේවිකාවන්ට උපකාර පැතීමට කෙනෙකු නැත

***අතවර සහ හිරිහැරවලින් ප්‍රමාණවත් ආරක්ෂාවක් නොමැතිවීම***

(කුවේට් නගරය, 2006 ඔක්තෝබර් 06) - අතවර කරන හාම්පුතුන්ගෙන් පලායාමට උත්සාහ කරන ගෘහ සේවක සේවිකාවන් "සේවයෙන් පලායාමේ" අපරාධ චෝදනාවලට මුහුණදෙන අතර, තම හාම්පුතුන්ගේඅවසර නොගෙන ඔවුන්ට සිය රැකියාව වෙනස්කල නොහැකි වබ හියුමන් රයිට්ස් වොච් සංවිධානය අද නිකුත්කළ වාර්තාවකින් පවසයි. තමනට වැටුප් නොගෙවන, නිවාඩු දිනයකින් තොරව දවසේ දීර්ග පැය ගණනාවක් සේවයෙහි යෙදීමට බලකරන, නිසි ආහාරයක් ලබානොදෙන හෝ තමන්ට ලිංගික හෝ ශාරීරික අතවර කරන සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන්ට කුවේටයේදී ලැබෙන්නේ ඉතා සීමිත ආරක්ෂාවක් පමණි.

"හැරෙන හැරෙන අත පවුරු වළලු: අනුග්‍රහ දැක්වීමේ කුවේටයේ ක්‍රියාදාමය මගින් සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන් සූරාකෑම" මැයෙන් යුත් පිටු 97 ක වාර්තාව මගින් මෙම සේවක සේවිකාවන් සූරාකෑමට හෝ අතවරයට ලක්වෙන රැකියාවල සිරවී සිටින ආකාරයත් හාම්පුතාගේ අවසරයකින් තොරව එවැනි රැකියාවකින් ඉවත්ව ගියහොත් ඔවුන්ට එරෙහිව අපරාධ චෝදනා එල්ලවීමේ තර්ජනයට මුහුණදෙන අන්දමත් විස්තර කෙරේ. "සේවය හැරගියවුන්" ලෙසින් වාර්තාකෙරෙන සේවකයන් අත්අඩංගුවට ගන්නා ආණ්ඩුවේ බලධාරීහු එවැනි බොහෝ අවස්ථාවල ඔවුන් තමන් මුහුණදුන් අතවරයන්ට එරෙහිව නීතියේ පිහිට පතා තිබුනත් ඔවුන් පිටුවහල් කරති .

"කුවේටයේදී හාම්පුතාට සියලුදේ තීරණය කිරීමේ බලතල හිමිවන," බව හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ මැදපෙරදිග කටයුතු පිලිබඳ අධකෂිකා සේරා ලී විට්සන් පැවසීය. "අතවරයට හෝ සූරාකෑමට ලක්වූ සේවිකාවන් පලායාමට හෝ පැමිණිලි කිරීමට උත්සාහ කළහොත්, 'සේවය හැරගියවුන්' ලෙසින් ඔවුන්ට චෝදනාකොට ඔවුන් රටින් පිටුවහල් කිරීමට රටේ නීතියෙන් ඉඩකඩ සලසාදී තිබේ. මේ සේවක සේවිකාවන්ට හාම්පුතාගේ කරුණාව මත යැපෙන්නට - හෝ කරුණාවක් නොමැතිනම් පීඩා විඳින්නට- ආණ්ඩුව කටයුතු සලස්වාතිබේ".

2011 පෙබරවාරි මාසයේදී අනුග්‍රහ දැක්වීමේ (කෆාලා) ක්‍රමවේදය අවලංගු කරන බවත්, හාම්පුතා මත පදනම්වූ ඒ ක්‍රමය වෙනුවට ආණ්ඩුවේ පාලනය යටතේ ක්‍රියාත්මක වන රැකියා අධිකාරියක් පිහිටුවන බවත් ජනගහනයට සාපේක්ෂව වැඩිම ගෘහ සේවක සේවිකාවන් අනුපාතයක් සිටින මැදපෙරදිග රටවන කුවේටය 2010 සැප්තැම්බර් 26 වෙනිදා නිවේදනය කළේය. මෙය ඉතා වැදගත් ප්‍රතිසංස්කරණයක් වනමුත්, රටේ සේවය කරන සංක්‍රමණික සේවකයන්ට එමගින් කිසියම් නීත්‍යානුකූල රැකවරණයක් ඇතිකරනේද යන්න පිළිබඳව හෝ මේ ප්‍රතිසංස්කරණ ගෘහ සේවක සේවිකාවන්ට අදාළ වන්නේද යන්න සම්බන්ධයෙන් ආණ්ඩුව කිසිවක් සඳහන් නොකළේය.

660,000 කට අධික සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන්, මිලියන 1.3 ක ජනගහනයක් වෙසෙන මේ කුඩා ගල්ෆ් කලාපීය රාජ්‍යයේ කම්කරුවන් අතරින් තුනෙන් එකක් පමණවේ. එහෙත් අනෙක් කම්කරුවන් ආරක්ෂාකරන රටේ කම්කරු නීති ගෘහ සේවක සේවිකාවන්ට බලනොපායි. 2010 පෙබරවාරි මාසයේදී තරම් මෑතදී පුද්ගලික අංශය වෙනුවෙන් නව කම්කරු නීතියක් සම්මතකළ කුවේටයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් එහිදීද ගෘහ සේවක සේවිකාවන් එයට ඇතුලත් කිරීමට අපොහොසත්වීම මඟින් පැවති තත්ත්වය යලිත් වරක් තහවුරු කළේය.

"අතවර කරන හාම්පුතෙකුගෙන් පැනයාම කිසිසේත්ම නීතිවිරෝධී වියයුතු නැති," බව කුවේටයේ ගෘහ සේවක සේවිකාවන්ට නිරන්තරයෙන් උපදේශන සේවා සපයන එක් ක්‍රියාධරයෙකු පැවසීය. "සමහර වෙලාවට කාන්තාවෝ ඇවිල්ල මට කියනවා, 'දන්නවද ඒ ගෙදරදි මට කරපු දේවල්?, ඒගොල්ල මට ගැහුවා, මූනට

කෙලගැහුව  ඉතින්  මට විරුද්ධව නඩුවක් තියෙන්නේ කොහොමද? කියල," තම නම හෙළිනොකරන මෙන් ඉල්ලාසිටි ඒ ක්‍රියාධරයා පැවසීය.

කුවේටයේදී තමන්ට සැලකූ අන්දම පිළිබඳව ශ්‍රී ලංකාවේ, ඉන්දුනීසියාවේ, පිලිපීනයේ සහ ඉතියෝපියාවේ සිට පැමිණි ගෘහ සේවක සේවිකාවන් තම තානාපති කාර්යාලවලට පැමිණිලි 10,000 කට වඩා ඉදිරිපත්කොට තිබෙන බව 2009 දී හියුමන් රයිට්ස් වොච් සංවිධානය  විසින් එක්රැස්කරන ලද දත්ත අනුව දක්නට ලැබේ.

කුවේටයේ ආණ්ඩුව විසින් දැනට පවතින කම්කරුවන්ට අනුග්‍රහ දැක්වීමේ ක්‍රියාපිළිවෙත සංශෝධනය කිරීමේදී "සේවය හැරයාම " රටේ නීතිය උල්ලංඝනය  කිරීමක් බවට පවතින විධිවිධානය ඉවත්කිරීමද එයට ඇතුලත්වියයුතු බව පවසන හියුමන් රයිට්ස් වොච් සංවිධානය, හාම්පුතාගේ අවසරයකින් තොරව කම්කරුවන්ට තම රැකියාව මාරුකිරීමට අවසර ලබාදිය යුතු බව පවසයි. හාම්පුතුන් කම්කරුවන්ගේ  අයිතිවාසිකම් උල්ලංඝනය කරන අවස්ථාවල ආණ්ඩුව කම්කරුවන් අත්අඩංගුවට ගෙන ඔවුන්  රටින් පිටුවහල් කිරීම නවත්වා, ඒ වෙනුවට ගෘහ සේවක සේවිකාවන්ට හදිසි නවාතැන් පහසුකම් ලබාදී ඔවුන්ගේ පැමිණිලි විභාගකිරීමේ ක්‍රියාදාමය වේගවත් කලයුතුය.

තමන් මාස 13 ක් මුලුල්ලේ  කිසිදු වැටුපක් නොලබා සේවයකළ බව නේපාලයේ සිට පැමිණි 23 හැවිරිදි ගෘහ සේවිකාවක වන තිල්කුමාරි පුන් හියුමන් රයිට්ස් වොච් සංවිධානයට  පැවසීය.  තමන්ගේ පියාට  හදවත් සැත්කමක් කිරීමට නියමිත බැවින් යලි නේපාලයට යාම සඳහා තම වැටුප ලබාදෙනමෙන් ඇය දිගින් දිගටම හම්පුතාගෙන් ඉල්ලා සිටියා ය. මාස දහයක් මුළුල්ලේ හාම්පුතාගෙන් කොටරම් ඉල්ලීම් කලත් වැටුප නොලැබුන විට  ඇය ආධාර පතා පොලීසියට  ගියත්, පොලිසිය විසින් එහිදී ඇය රඳවාගත් බව ඇය පැවසීය . "මට  පොලිස් ස්ථානයේ සිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යාමට සිදුවිය. මගේ බාබා සහ මාමා (හාම්පුතුන්) මට විරුද්ධව පොලිසියේ පැමිණිල්ලක් දමා තිබුණු" බව ඇය පැවසීය.

ගෘහ සේවක සේවිකාවන් 49 දෙනෙකු, කුවේටයේ පිහිටි කුවේටයට කම්කරුවන් පිටත්කරන රටවල තානාපති කාර්යාලවල නිලධාරීන් සහ කුවේටයේ කම්කරු හා  සමාජ කටයුතු අමාත්‍යංශයේ මෙන්ම ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ නිලධාරීන් සමඟද පවත්වන ලද සම්මුඛ සාකච්චා ඇසුරෙන්  "හැරුණු හැරුණු අත පවුරු වළලු" වාර්තාව පදනම්වී තිබේ. එමෙන්ම හියුමන් රයිට්ස් වොච් සංවිධානය හාම්පුතුන්, දේශීය මානව හිමිකම් හා සිවිල් සමාජ ක්‍රියාධරයන්, නීතිවේදීන් සහ උගතුන් සමඟද සම්මුඛ සාකච්චා පවත්වන ලදී.

වැටුප් නොගෙවීම, නිවාඩු දිනයක් ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සහ ශාරීරික හා ලිංගික අතවර කිරීම ඇතුළු අතවර ගණනාවක්ම හියුමන් රයිට්ස් වොච් සංවිධානයට මුණගැසුණු  ගෘහ සේවිකාවන් විසින් සඳහන් කරන ලදී . එහෙත් එම අතවරවලට එරෙහිව ඉදිරිපත්කරන පැමිණිලිවලින් කිසියම්ම හෝ  ප්‍රතිපලයක් නොලැබෙනසුලු තරම් බව ඔවුහු පැවසූහ.

ඉතා දීර්ග කාලයක් දිග ඇදෙන නඩුවක් හමාරවනතුරු හෝ අනුග්‍රාහකයා සමඟ සාකච්චා හමාරවනතුරු තානාපති කාර්යාලවලින් ලබාදෙන, විශාල පිරිසක් වෙසෙන නවාතැනක සති ගණනක් හෝ මාස ගණනක් ගතකිරීමට සූදානම් නම් පමණක් තමන්ට සිදුවූ අතවර පිලිබඳ පැමිණිල්ලක් විභාගකිරීම සහතික කොටගත හැකි බව ඔවුන්ගේ අත්දැකීමයි.  හාම්පුතා විසින් ඉදිරිපත්කරනු ලබන  "සේවයෙන් පලායාමේ"  වාර්තාවක් මඟින් නිත්‍යානුකූලව රටේ රැඳීසිටීමේ සංක්‍රමණික සේවිකාවකගේ අයිතිය  ස්වයංක්‍රීයව අහෝසිවන අතර, ඇගේ පැමිණිල්ල පිලිබඳ තීන්දුවක් ලැබෙන තුරු වෙනත් රැකියාවක් සොයාගැනීමේ හෝ තම රටට මුදල් යැවීමේ නිත්‍යානුකූල අයිතිය ඇයට අහිමිවේ.

“ගෘහ සේවිකාවන් බොහෝවිට  තම මවුරටේ සිටින දරුපවුල් රකින්නේ තමන් උපයන වැටුපෙන්," බව විට්සන් පැවසීය. "මේ සේවිකාවන්ගෙන් බොහෝදෙනාගේ මානව හිමිකම් උල්ලංඝණයවී තිබෙන අවස්ථාවල පවා රැකියාවක් කිරීමට හෝ ඔබ මොබ යාමට පවා නිදහසක් නොමැතිව මේ සේවිකාවන් මාස ගණන් සෙනඟ පිරුණු තාවකාලික නිවාසවල කල්ගතකලයුතු නැත".

ගෘහ සේවක සේවිකාවන්ට කුවේටයේ කම්කරු නීති අදාල නොවන බැවින් නොගෙවූ වැටුප් ලබාගැනීම සඳහා ඔවුන්ට ඉතා දුෂ්කර නඩු විභාගවලට මුහුණදීමට සිදුවේ. අතවරයක්  හෝ ශ්‍රම සූරාකෑමක් සිදුවූයේනම් එය සිදුවූයේ පුද්ගලික නිවසක් තුල බැවින් එය සනාථකිරීම සඳහා සාක්ෂි ඉදිරිපත්කිරීම ඉතා දුෂ්කරවියහැකිය.

ඉතා විශාල සංක්‍රමණික කම්කරු ජනගහනයක් වෙසෙන කුවේටයේ කම්කරුවන්ගේ දුක්ගැනවිලි අතරින් වැටුප් පිලිබඳ පැමිණිලිවලට ප්‍රමුඛස්ථානය හිමිවන නමුත් කුවේටය කම්කරු උසාවිවල වැඩකටයුතු ඉක්මන්කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකරයි. දීර්ග කාලයක් බලාසිටීමට සිදුවීම, තමන්ගේ අයිතිවාසිකම් හා අධිකරණ පිහිට පැතීමේ හැකියාව පිළිබඳව නිසි අවබෝධයක් නොමැතිවීම සහ සාධාරණය ඉටුකරගැනීමේ ඉඩප්‍රස්ථා ඉතා සීමිතවීම නිසා බොහෝ කම්කරුවෝ අධිකරණ පිහිට පැතීමෙන් වලකිති.

තම පැමිණිලි සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු නොකිරීමට ගෘහ සේවක සේවිකාවන් තීරණය කරන අවස්ථාවල පවා ඔවුන්ට රටින් පිටවයාමට පෙර දීර්ග කාලයක් බලාසිටීමට සිදුවේ. හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් සම්මුඛ සාකච්චාවලට ලක්කරන ලද රැකියාව අත්හැරගිය කම්කරුවන් අතරින් එසේ රැකියාව හැරයාමෙන් පසුව තම හාම්පුතාගෙන් යලි ගුවන් ගමන් බලපත්‍රය ලබාගැනීමට සමත්වී තිබුනේ කිහිපදෙනෙකු පමණි.

කම්කරුවන් රටින් බැහැරවයාම ප්‍රමාදකිරීම සහ මතභේදයක් සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර කෙරෙන සාකච්චාවලදී කේවල් කිරීමේ භාණ්ඩයක් ලෙසින් යොදාගැනීම සඳහා හාම්පුතුන් ඔවුන්ගේ ගුවන් ගමන් බලපත්‍ර තම භාරයට ගනී. කිසියම් ගෘහ සේවිකාවක තම කොන්ත්‍රාත්තුවට අදාල සියලු වගකීම් ඉටුකොට තිබෙන අවස්ථාවල හෝ සේවිකාවක අතවරකරන හාම්පුතුන්ගෙන් පලාගිය අවස්ථාවල පවා හාම්පුතුන් විසින් “ සේවයෙන් හැරගිය" ලෙස වාර්තාකරණ ලද අවස්ථාවක , ආණ්ඩුවේ බලධාරීන් විසින් තමන්ට එරෙහි චෝදනාවලින් නිදහස්කරනතුරු සේවකයන්ට අතිරේක කාලයක් බලාසිටීමට සිදුවේ.

වසර දෙකහමාරක කොන්ත්‍රාත්කාලය හමාරයේ තම හාම්පුතා තමන්ට යලි සියරට යාමට අවසරදීම ප්‍රතික්ෂේප කල බව පවසන පිටුවහල් කිරීම සඳහා රඳවාසිටින කඳවුරකදී හමුවූ ඉන්දුනීසියානු ගෘහ සේවිකාවක වන නුර් ඩබ්ලිවු, ඉන්පසුව තමන් නිවසෙන් පලායාමෙන් අනතුරුව තම ගුවන් ගමන් බලපත්‍රය යලි ලබාදීම ප්‍රතික්ෂේප කල බවද ප්‍රකාශකලාය .“ මම ඊට පස්සේ මගේ තානාපති කර්යලේට ගියා"," ඇය පැවසීය. "එයාල එතන ඉඳල මාමට..ටෙලිෆෝන් කලා (මගේ හාම්පුතා) එතකොටත් මාම කිවුව පාස්පෝට් එක දෙන්න බැහැයි කියල . ඒ නිසා මට පිටුවහල් කරන කඳවුරට එන්න සිද්දවුනා".

"වැටුප් නොගෙවා බලහත්කාරයෙන් වැඩෙහි යොදවන ලද, ආහාර පවා අහිමිකරන ලද හෝ අමානුෂික ලෙස සලකන ලද සේවක සේවිකාවන් රැඳවුම් මධ්‍යස්ථානවලට හෝ සිරකඳවුරුවලට යායුතු නැති අතර, පිටුවහල් කිරීමේ ක්‍රියාදාමය මඟින් යලි සියරට බලා යායුතු නැති," බව විට්සන් පැවසීය. " හාම්පුතුන්ගේ අතවර ගැන පැමිණිලි කරන කම්කරුවන්ට ආණ්ඩුව රැකවරණ ලබාදිය යුතු අතර, ඒවනවිටත් අතවරවලට ලක්වී සිටින කාන්තාවන්ට පවා නෛතික වැටකඩුලු පැනවීමට හාම්පුතුන්ට අවස්ථාව ලබාදෙන නීතිමය විධිවිධාන ඉවත්කලයුතුය".

කුවේට ආණ්ඩුව ගෘහ සේවිකාවන් වෙනුවෙන් ඇඳන් 50කින් යුත් නිවාසයක් පවත්වාගෙන යනමුත්, එයට අදාල ගෘහ සේවිකාවන් යොමුකලහැක්කේ තානාපති කාර්යාලවලට පමණි. එමෙන්ම තානාපති කාර්යාලවලට පවා එසේ යොමුකලහැක්කේ පොලිසිය විසින් ඔවුන්ට එරෙහි සියලු චෝදනාවලින් නිදහස් කිරීමෙන් අනතුරුව වන බැවින් ආණ්ඩුවේ එම නිවාසයට පැමිණීමට ප්‍රථම කාන්තාවන්ට ඉතා දීර්ග කාලයක් තානාපති කාර්යාල විසින් සපයනු ලබන නවාතැන්පොලවල ලැගුම් ගැනීමට සිදුවේ. සියගණනක් ගෘහ සේවිකාවන්ට එවැනි නවාතැන් පොලක් අත්‍යවශ්‍යව තිබුනත්, බොහෝ තානාපති කාර්යාල සපයන නිවාසවල ලැගුම්ගැනීමට ඉඩකඩ නොමැති තත්ත්වයකදී පවා, හියුමන් රයිට්ස් වොච් සංවිධානය එහි සංචාරය කල අවස්ථාවේ එම නිවාසය බොහෝදුරට හිස්ව තිබුණි.

"දුෂ්ට හාම්පුතුන් විසින් ගෘහ සේවිකාවන් සූරාකන අවස්ථාවල, ආණ්ඩුව ඔවුන්ට තවදුරටත් දඬුවම් නොකළයුතු," බව විට්සන් පැවසීය. " ආණ්ඩුවේ නිලධාරීන් කණ්ලා නීතියේ ප්‍රතිසංස්කරණ ගැන අවුරුදු ගණනාවක් මුළුල්ලේ සාකච්චා කරමින් සිටින නමුත්, කම්කරුවන්ගේ අයිතිවාසිකම් පොතේ පමණක් නොව ප්‍රයෝගිකව ආරක්ෂා කෙරෙන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කාලය එළැඹ තිබේ".

**"කුවේටය : අතවරයට ලක්වූ ගෘහ සේවක සේවිකාවන්ට උපකාර පැතීමට කෙනෙකු නැත" වාර්තාව කියවීම සඳහා කරුණාකර http://www.hrw.org/node/93334 වෙබ් අඩවියට පිවිසෙන්න.**

**මැදපෙරදිග රටවල සංක්‍රමණික ගෘහ සේවිකාවන් සම්බන්ධ හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ අනෙක් වාර්තා සඳහා:**

- "ලෙබනනය: ගෘහ සේවක සේවිකාවන් ආරක්ෂාකිරීමට අධිකරණ පද්ධතිය අපොහොසත්වීම" (http://www.hrw.org/en/news/2010/09/15/lebanon-judiciary-failing-protect-domestic-workers)

- "මන්දගාමී ප්‍රතිසංස්කරණ:ආසියාවේ සහ මැදපෙරදිග සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන් ආරක්ෂාකිරීම" (http://www.hrw.org/node/90055)

- "අපනයනයකොට නිරාවරණය කිරීම: සවුදි අරාබිය, කුවේටය, ලෙබනනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන්ට එරෙහිව කෙරෙන අතවර" (http://www.hrw.org/en/reports/2007/11/13/exported-and-exposed-1)

වැඩිවිස්තර සඳහා කරුණාකර පහත දැක්වෙන අය අමතන්න:

කුවේට් නගරයේදී, සේරා ලී විට්සන් (ඉංග්‍රීසි) +1-718-362-0172 (ජංගම දුරකථනය); හෝ whitsos@hrw.org
කුවේට් නගරයේදී, ප්‍රියංකා මොටපාර්ති (ඉංග්‍රීසි) +1-917-744-4004 (ජංගම දුරකථනය); හෝ +965-6004-3704 (ජංගම දුරකථනය); හෝ motapap@hrw.org
කුවේට් නගරයේදී, නිශා වාරියා (ඉංග්‍රීසි, ගුජරාටි) +1-917-617-1041(ජංගම දුරකථනය); හෝ varian@hrw.org
අම්මාන් නගරයේදී, ෆාදි අල් බාදී (අරාබි, ඉංග්‍රීසි) +962-79-699-2396 (ජංගම දුරකථනය); හෝ alqadif@hrw.org
මියුනික් නගරයේදී, ක්‍රිස්ටොප් විල්ක (ඉංග්‍රීසි, අරාබි, ජර්මන්) +49-891-392-6193 හෝ wilckec@hrw.org